(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

**අංක. 7.]**

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2010 මැයි මස 19 වැනි බදාදා පූ. භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0005/’10

1\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගොවිජන කේන්ද්‍ර බල ප්‍රදේශ සංඛ්‍යාව කොපමණද;

(ii) එම බල ප්‍රදේශ කවරේද;

(iii) ගොවිජන කෙන්ද්‍ර මට්ටමින් සිටින අද ගොවියන් සංඛ්‍යාව කොපමණද ;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අද ගොවියන්ගේ ලිපිනයන් ඇතුළු නාම ලේඛනයක් ගොවිජන කෙන්ද්‍ර මට්ටමින් ලබා දීමට එතුමා කටයුතු කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0011/’10

2\.

ගරු රවි කරුණානායක මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මහින්ද චින්තන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම යටතේ ස්ථාපනය කර ඇති “මග නැගුම” ව්‍යාපෘතිය මගින් 2008 වර්ෂයේ සිට මේ දක්වා ඉදිකර ඇති මාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් මාර්ගය සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iii) එකී ඇස්තමේන්තුගත මුදලින් මේ දක්වා වැයකර ඇති මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ව්‍යාපෘතිය යටතේ ස්ථාපනය කර ඇති මහාමාර්ග ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ සමාගම යටතේ ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම සමාගම යටතේ දිවයින පුරා විවෘත කර ඇති කාර්යාල සහ රථවාහන අංගන සංඛ්‍යාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0006/’10

3\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකාවේ ගොවිජන කේන්ද්‍ර බල ප්‍රදේශ සංඛ්‍යාව කොපමණද ;

(ii) ඒවා කවරේද ;

(iii) ගොවිජන කේන්ද්‍ර මට්ටමින් සිටින්නා වූ අද ගොවියන් සංඛ්‍යාව කොපමණද ;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) අද ගොවියන්ගේ ලිපිනයන් ඇතුළු නාම ලේඛනයක් ගොවිජන කේන්ද්‍ර මට්ටමින් ලබා දීමට එතුමා කටයුතු කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0012/’10

4.

ගරු රවී කරුණානායක මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 1999 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා වයඹ පළාත් සභාවේ ගිණුම් වාර්තා එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) ඉහත ගිණුම් වාර්තාවලින් අනාවරණය වූ දූෂණ හා වංචාවලට සම්බන්ධ නිලධාරීන්ට එරෙහිව විනය පරීක්ෂණ පැවැත්වූයේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) එම දූෂණ හා වංචාවලට සම්බන්ධ නිලධාරීන් හා අනෙකුත් පුද්ගලයන්ට එරෙහිව ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ සවිස්තර වාර්තාවක් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) (i) විනය පරීක්ෂණ නිගමනයන්ට අනුව චූදිත නිලධාරීන් සේවයෙන් පහ කිරීමට කටයුතු කළේද;

(ii) නොඑසේ නම්, චූදිත නිලධාරීන් තවදුරටත් සේවයේ යොදවාගෙන සිටින බලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0007/’10

5.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) කිරිදිඹිය මෝය සිට දොරඹය මෝය දක්වා අක්කර 396ක් පුරා පැතිරුණු, කිලෝමීටර් 4.05ක් දිග, කිලෝමීටර් 1.05ක් පළල, මීටර් 30ක් උස් වූ මාගම වැලිවැටිය ගැන එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම වැලිවැටිය නිසා කුඹුරු අක්කර 676ක් හා අතිරේක බෝග අක්කර 31 ක ගොවිබිම් ප්‍රමාණයක් මුහුදු රළෙන් ආරක්ෂා වන බවත්;

(ii) මෙම වැලිවැටිය දකුණලකට අවේනික පළු, වීර, රණවරා යන ශාකයන්ගෙන් ආවරණය වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) මෙම වැලිවැටිය එහි ඇති ඉල්මනයිට් සහ ග්‍රැනයිට් යන ඛනිජ ලබා ගැනීම සඳහා විදේශීය සමාගමක් වෙත පවරා ඇති බවත්;

(ii) අඩි අටක් පමණ යටින් පිහිටා ඇති මෙම ඛනිජ ලබා ගැනීමේදී පොළොව මට්ටමේ සිට ඉහළින් ඇති වැලි ස්ථරයෙන් 60%ක් පමණ ඉවත් කිරීමෙන් මාගම සහ අවට ගම්මානවලට අහිතකර බලපෑම් ඇති වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) එම අහිතකර බලපෑම් මගහරවා ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) ව්‍යාපෘති කමිටුව මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රදේශවාසීන්ගේ කැමැත්ත විමසුවේද;

(iii) ජනතා විරෝධතා මධ්‍යයේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද්දේ නම්, එසේ කරන ලද්දේ කාගේ මග පෙන්වීමක් යටතේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

ගරු රවී කරුණානායක මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) අප රටේ ධීවරයින් විශාල සංඛ්‍යාවක් ඉන්දීය රජයේ අත්අඩංගුවේ පසුවන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2009 ජනවාරි මාසයේ සිට මේ දක්වා කාලය තුළ ඉන්දීය රජය විසින් අත්අඩංගුවට ගනු ලැබූ ධීවරයින්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට අත්අඩංගුවේ පසුවන ධීවරයින් සංඛ්‍යාව කොපමණද;

(iii) අත්අඩංගුවේ පසුවන ධීවරයින් නිදහස් කර ගැනීමට ගෙන තිබෙන ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2010.05.04 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම පැවැත්වෙන කාල වේලා පූ. භා. 9.30 සිට අ. භා. 4.30 දක්වා විය යුතු ය. අ. භා. 4.30 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

2.

ගරු දයාසිරි ජයසේකර මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 1),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"සමස්ත ලංකා මධ්‍ය විද්‍යාල ආදී ශිෂ්‍ය සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

3.

ගරු ජානක බණ්ඩාර මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 2),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"පුරාවස්තු සුරැකීමේ සංවිධානය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1),— විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2010 මැයි 18),— "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිතුමා විසින් සාදන ලදුව, 2009 සැප්තැම්බර් මස 30 වැනි දිනැති, අංක 1621/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, 2010.05.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතුය."

යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*2.

විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2),— විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2010 මැයි 18),— "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිතුමා විසින් සාදන ලදුව, 2009 නොවැම්බර් මස 09 වැනි දිනැති, අංක 1627/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, 2010.05.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතුය."

යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*3.

විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 3),— විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2010 මැයි 18),— "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිතුමා විසින් සාදන ලදුව, 2009 දෙසැම්බර් මස 20 වැනි දිනැති, අංක 1632/37 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, 2010.05.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතුය."

යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*4

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 වැනි දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*5

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය,— 2009.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයාගේ (ඔම්බුඩ්ස්මන්) මාසික වැටුප පහත සඳහන් පරිදි විය යුතු යැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156(3) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්) | රු. 65,000/- |

තවද, මෙම මාසික වැටුප තුළ මීට ප්‍රථම පාර්ලිමේන්තුව විසින් අනුමත කොට ඇති ගෙවල් කුලී දීමනාව ද ඇතුළත්ව ඇති බැවින්, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයාට (ඔම්බුඩ්ස්මන්) රු. 65,000/- ක මාසික වැටුපට අමතරව 2009.01.01 දින සිට වෙනත් දීමනා සඳහා හිමිකමක් නොමැති බව ද, මෙම පාර්ලිමේන්තුව විසින් වැඩිදුරටත් නිශ්චය කරනු ලැබේ.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

* **සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**